# පළාත් සභා නිවේදන

අංක : ව/පස/2/1/19(32).

## වයඹ පළාත් සභාව

### 2003 අංක 04 දරන වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ, පළාත් සභාව විසින් 2003.12.16 වැනි දින සම්මත කරන ලදුව 2004.01.09 වැනි දින වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේම දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

එස්. හිරිමුතුගොඩ,
ලේකම්,
වයඹ පළාත් සභාව.

2004 පෙබරවාරි මස 23 වැනි දින,
කුරුණෑගල.
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

(වයඹ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය 2004.01.09)

**2003 අංක 4 දරන වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය**

පූර්ව ළමා අධ්‍යාපන ආයතන කළමනාකරණය හා අධීක්ෂණය මඟින් වයඹ පළාත තුළ පූර්ව ළමා අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිණිස පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය 2003 අංක 4 දරන වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

*I වන කොටස*

*වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය*

වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පිහිටුවීම

2 (1) මෙහි මින්මතු අධිකාරිය වශයෙන් සඳහන් කෙරෙන වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය නමින් අධිකාරියක් මෙයින් පිහිටවනු ලැබේ.

(2) අධිකාරිය (1) වන උප වගන්තියේ ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීමද, අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීමද කරනු ලැබිය හැකිය.

අධිකාරියේ අරමුණු

3 (1) අධිකාරියේ අරමුණ වන්නේ වයඹ පළාත තුළ පූර්ව ළමා අධ්‍යාපන අධීක්ෂණය හා කළමනාකරණය කිරීම තුළින් පළාතේ වයඹ පූර්ව ළමා අධ්‍යාපනය සංවර්ධනය කිරීමයි.

අධිකාරියේ කාර්යයන්

4 අරමුණු සපුරා ගැනීම පිණිස අධිකාරිය විසින් මතු දැක්වෙන කාර්යයන් කළ හැකිය.

(1) වයඹ පළාතේ පූර්ව ළමා අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා ආධාර ලබාදීම ද.

(2) පූර්ව ළමා අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම, ඒවායේ කටයුතු අධීක්ෂණය හා නියාමනය

(3) පූර්ව ළමා අධ්‍යාපන ආයතනවල ශිෂ්‍යයන්ගෙන් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් කොන්දේසි පැනවීම.

(4) පූර්ව ළමා අධ්‍යාපන ආයතනවල උපදේශක උපදේශිකාවන් සඳහා අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් නියම කිරීම.

(5) පූර්ව ළමා අධ්‍යාපන ආයතනවල උපදේශක උපදේශිකාවන් පුහුණු කිරීම.

(6) පූර්ව ළමා අධ්‍යාපන ආයතනවල උපදේශක උපදේශිකාවන් පුහුණු කිරීම සඳහා ගුරු පුහුණු ආයතන පිහිටුවා පවත්වාගෙන යාම හා නිසි පුහුණුව ලැබූ අයට සහතික පත්‍ර ලබාදීම.

(7) පූර්ව ළමා අධ්‍යාපන නව්කරණයන්ට අදාළ සේවාස්ථ සැසි පැවැත්වීම.

(8) පළාත් පාලන ආයතන ඇතුළු අවශේෂ සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන පූර්ව ළමා අධ්‍යාපන ආයතනවල පාලනය හා කළමනාකරණය ගැන ප්‍රමිතිය නියම කිරීම.

(9) පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධනයේ වැදගත්කම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

(10) ඉහත නිශ්චය වශයෙන්ම සඳහන් කර නැතත්, පළාත තුළ පූර්ව පූර්ව ළමා අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

5. ස්වකීය කාර්යයන් ඉටුකර ගැනීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි බලතල අධිකාරිය වෙත තිබිය යුතු අතර, විශේෂයෙන් පහත සඳහන් බලතල තිබිය යුතුය. අධිකාරියේ බලතල

(1) යම් නිශ්චල හෝ චංචල දේපලක් යම් ආකාරයකින් අත්කර ගැනීම හා දැරීම, බද්දීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(2) අධිකාරිය විසින් සලසනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු හෝ මුදල් අයකිරීම.

(3) අධිකාරියේ කාර්ය ඉටුකිරීම සඳහා මුදල් උපකරණ හා වෙනත් අධාර ලබා ගැනීම.

(4) අධිකාරියේ නිලධරයන් හා සේවකයන් සඳහා වැඩ ඉටුකිරීමේ ප්‍රමිතීන් පිහිටුවීම සහ එකී ප්‍රමිතීන්ට අනුකූලව ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැඩඉටු කිරීම, ඇගැයීම සහ ඒ පිළිබඳව ක්‍රියා කිරීම.

(5) අධිකාරියේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පත්වීම්,පුහුණු කිරීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික ගෙවීම්, විනය පාලනය, හැසිරීම සහ නිවාඩු ලබාදීම ඇතුළු ඒ නිලධරයන් හා සේවකයින්ට අදාළ රීති සෑදීම.

(6) අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීමට අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට ඇතුළත් වීම.

(7) අධිකාරියේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම.

(8) අධිකාරියේ කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන හෝ ආනුෂංගික වන හෝ බලපාන වෙනත් සියලු දේ කිරීම.

6. (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත මෙහි මින්මතු මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන කළමනාකරණ මණ්ඩලයක් වෙත මෙයින් පැවරේ. කළමනාකරණ මණ්ඩලය පිහිටුවීම හා එහි සැසුකිය

*(අ)* නිලබලයෙන් සාමාජිකයන් එනම් -

i. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා .
ii. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
iii. පළාත් පාලන පළාත් කොමසාරිස්
iv සමාජ සේවා පළාත් අධ්‍යක්ෂ
v. පළාත් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්
vi. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

*(ආ)* i. අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පූර්ව ළමා අධ්‍යාපනය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ලබා ඇති රාජ්‍ය අංශයේ නොවන දෙදෙනකු,

ii. අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පූර්ව ළමා අධ්‍යාපනය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ලබා ඇති රාජ්‍ය අංශයේ තැනැත්තකු.

(2) යම් තැනැත්තෙක් -

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට,

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වූවහොත් ; හෝ

(ආ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් සකසන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් සෘජුව හෝ වක්‍රව දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(ඇ) ඒ තැනැත්තා හට මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කාර්යයක් ඉටු කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑහැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවයක් තිබේ නම්; හෝ

නුසුදුස්සෙකු වන්නේය.

(3) 6 වන වගන්තියේ (1) (ආ) උප වගන්තිය යටත් පත්කරනු ලබන සෑම සාමාජිකයකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, අවුරුදු 03ක කාලයක් ධුරය දරන්නේය.

(4) 6 වන වගන්තියේ (1) (ආ) උප වගන්තිය යටතේ පත්කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයෙකු, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ මිය යාම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරය අත්හැරියොත් මිස තමා අනුප්‍රාප්ත වන සාමාජිකයා ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දරන්නේය.

(5) 6 වන වගන්තියේ (1) (ආ) උප වගන්තිය යටතේ පත්කරනු ලබන සාමාජිකයෙකු රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ස්වකීය ධුරයේ කාර්යය ඉටුකිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් එකී ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය.

**කළමනාකරණ මණ්ඩලයේ පත්කළ සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.**

7. අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ සභාපති විය යුතු අතර, අධිකාරියේ අධ්‍යක්ෂවරයා එහි ලේකම් විය යුතුය. 6 වන වගන්තියේ (1) (ආ) උප වගන්තිය යටතේ පත්කරන ලද සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් හේතු දැක්වීමෙන් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

**කළමනාකරණ මණ්ඩලයේ පත්කළ සාමාජිකයන් ධුරයෙන් ඉල්ලා අස්වීම.**

8. 6 වන වගන්තියේ (1) (ආ) උප වගන්තිය යටතේ පත්කරන ලද සාමාජිකයෙකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

**කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත්කිරීම සඳහා යෝග්‍යතාව.**

9. 6වන වගන්තිය යටතේ සේවයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු හැර, 6 වන වගන්තියේ (1) (ආ) උප වගන්තිය යටතේ පත්කරන ලද යම් සාමාජිකයෙකු නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය.

**යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයෙකු පත් කිරීමේ දෝෂයක් තිබීම හේතුවෙන් ආයතනයේ කටයුතු අවලංගු වන සේ සලකනු නොලැබිය යුතු බව.**

10. කළමනාකරණ මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ යම් සාමාජිකයෙකු පත්කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් ආයතනයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත වන්නේ යයි නොසැලකිය යුතුය.

**සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.**

11. ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන්, අධිකාරියේ අරමුදලින් මණ්ඩලයේ සියළුම සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට හෝ ගෙවනු ලැබිය හැකිය.

12. (1) අවම වශයෙන් සෑම මසකටම එක් වරක් හෝ මණ්ඩලයේ රැස්වීම් පවත්වනු ලැබිය යුතුය. මණ්ඩලයේ රැස්වීම්.

(2) මණ්ඩලයේ සෑම රැස්වීමක් පිළිබඳවම අවම වශයෙන් දින 07කට පෙර ලිඛිත දැන්වීමක් මණ්ඩලයේ ලේකම්වරයා විසින් මණ්ඩලයේ එක් එක් සාමාජිකයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ රැස්වීමේ දී ඉටුකරනු ලබන කටයුතු පිළිබඳ ඒ දැන්වීමෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතුය.

(3) (2) වන උප වගන්තියේ විධිවිධාන වල කුමක් සඳහන් වුවද මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවන ලෙස කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් කරන ලද ලිඛිත ඉල්ලීමකින් පසුව, දින 07ක් ඇතුළත ලේකම්වරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණ පූරණය සාමාජිකයන් 03 දෙනෙකු විය යුතුය.

(5) සභාපතිවරයා මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක පැමිණ සිටින සාමාජිකයන් වැඩි දෙනෙකු විසින් තෝරාපත්කර ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(6) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට තම ධුරයේ කටයුතු තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබිය හැකිය.

(7) මණ්ඩලයේ රැස්වීමක දී තීරණය කරනු ලැබීමට ඇති යම් කාරණයක් හෝ දෙයක් පිළිබඳව ඡන්ද සමානව ඇති අවස්ථාවක දී සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

(8) මේ වගන්තියේ දක්වා ඇති විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින්, එහි රැස්වීම් පිළිබඳව සහ ඒ රැස්වීම් කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය පිළිබඳ තීරණය කරනු ලැබිය යුතුය.

## II කොටස

### *අධිකාරියේ අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් හා සේවකයන් පත්කිරීම*

13. (1) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිත ළමා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයට නොඅඩු අධ්‍යාපන සුදුසුකම් ඇති තැනැත්තකු අධිකාරියේ අධ්‍යක්ෂවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂවරයා, අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු අතර, ඒ තැනැත්තා මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා", යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය. අධිකාරියේ අධ්‍යක්ෂවරයා.

(2) (1) වන වගන්තිය යටතේ පත්කරනු ලබන අධ්‍යක්ෂවරයා මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, ස්වකීය පත්වීමේ දින සිට අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුතුය.

(3) මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට පවරනු ලැබිය හැකි බලතල, කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම ද, ඉටු කිරීම කළ යුතුය.

(4) (1) වන උප වගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂවරයා, අමාත්‍යවරයා විසින් හේතු දක්වමින් ධුරයෙන් ඉවත්කරනු ලැබිය හැකිය.

(5) ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් අධ්‍යක්ෂවරයාට ගෙවනු ලැබිය යුතුය.

(6) මිය යාමෙන් (4) වන උප වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ධුරය දරන තැනැත්තා විසින් තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන් අධ්‍යක්ෂවරයාගේ ධුරය හිස් වන්නේය.

(7) (4) වන උප වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අධ්‍යක්ෂවරයා ලෙස ධුරය දරන යම් තැනැත්තෙක් අධ්‍යක්ෂවරයා ලෙස නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතුය.

(8) අධ්‍යක්ෂවරයාගේ ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත් (1) වන උප වගන්තිය යටතේ පත් කිරීමක් කරනු ලබන තෙක් අධ්‍යක්ෂවරයාගේ කාර්ය ඉටු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයෙකු පත් කරනු ලැබිය හැකිය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය පත්කිරීම සම්බන්ධව කළමනාකරණ මණ්ඩලයේ බලතල.

14. (1) අධ්‍යක්ෂවරයා යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියේ අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ අනුමැතිය මත අධිකාරියේ කාර්ය මණ්ඩලය පත්කළ යුතුය.

(2) මේ ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව,

(අ) අධිකාරියේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් හා සේවකයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

(ආ) එවැනි නිලධරයන් සහ සේවකයන් සේවයෙන් නෙරපා දැමීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම.

(ඇ) එවැනි නිලධරයන්ගේ හා සේවකයන්ගේ වේතන, වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම.

(ඈ) එවැනි නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කිරීම සහ එවැනි අරමුදල් සඳහා යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම.

මණ්ඩලය විසින් කළ හැකිය.

(3) 14 (2) වන උප වගන්තියේ සඳහන් සියළු කාරණා හෝ ඉන් කිසිවක් සම්බන්ධව ප්‍රඥප්තිය යටතේ රීති සාදනු ලැබිය හැකිය.

පත්වීම සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල අධ්‍යක්ෂවරයා වෙත පැවරීම.

15 (1) අධිකාරියේ කාර්ය මණ්ඩලයට වෙනත් නිලධාරීන් හෝ වෙනත් සේවකයන් පත් කිරීමට අදාළ සියළු බලතල හෝ ඉන් කිසිවක් මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකිය. මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා වෙත පවරන ලද බලතල යටතේ අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද යම් නිලධරයන් සහ සේවකයන්ගේ පාරිශ්‍රමිකයන් ඇතුළු සේවා කොන්දේසි මණ්ඩලයේ එකඟත්වය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් නියම කළ යුතුය.

(2) මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබූ යම් තීරණයකට එරෙහිව මණ්ඩලය වෙත ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එම අභියාචනය පිළිබඳ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය විය යුතුය.

(3) අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු අධ්‍යක්ෂවරයා විසින් සේවයෙන් පහ කරනු ලැබූ විට මණ්ඩලය විසින් එකී සේවකයන් පහ කිරීම අනුමත කරනු ලැබ ඇත්නම් මිස, බලාත්මක නොවිය යුතුය.

පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් අධිකාරියේ කාර්ය මණ්ඩලය පත්කළ හැකි බව.

16 (1) මණ්ඩලයේ ඉල්ලීම පිට පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා ආණ්ඩුකාරවරයාගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් අයෙකුගේ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය. නැතහොත් තම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකිය.

(2) පළාත් සභා රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබ ඇති අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයා කෙරෙහි හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(3) පළාත් සභා රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කරනු ලැබ ඇති අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයා කෙරෙහි හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(4) යම් නිශ්චිත කාල සීමාවක් ද පළාත් සභාවට සේවය කිරීමට එකඟ වෙමින් පළාත් සභාව සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු අධිකාරිය මගින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරිය යටතේ සේවය කරන ලද යම් කාලසීමාවක් ඒ ගිවිසුම යටතේ වූ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා පළාත් සභාවට කරන ලද සේවයක් වශයෙන් සළකනු ලැබිය යුතුය.

17. ප්‍රඥප්තිය අනුමත කෙරෙන දිනයට පූර්වයෙන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට අනුයුක්තව දැනටත් සේවයේ යෙදී සිටින සෑම නිලධාරියකු හෝ සේවකයකුගේම එම පූර්ව සේවා කාල පරිච්ඡේදය එම නිලධාරියාට හෝ සේවකයාට අවාසියක් හෝ අසාධාරණයක් නොවන පරිදි ඔහුගේ සේවා කාලයට එකතු කළ යුතුය. ප්‍රඥප්තිය අනුමතවීමට පෙර බඳවාගත් කාර්ය මණ්ඩලය සඳහා පූර්ව සේවා කාලය ඔහුගේ සේවා කාලයට එකතු කළයුතු බව

## *III* කොටස

18. (1) "වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදල් අධිකාරිය විසින් පිහිටවිය යුතු අතර, එය වයඹ පළාත් සභාවේ වෙනම ගිණුමක් වශයෙන් පවත්වාගෙන යා යුතුය.

(2) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ තුන්වැනි කොටසේ විධිවිධාන එම අරමුදලට අදාළ විය යුතුය.

(3) අධිකාරිය සඳහා පළාත් සභාව විසින් වරින් වර ලබාදෙන සියළු මුදල් සහ අධිකාරියේ බලතල කාර්යයන් හා රාජකාරි ඉටුකිරීමේ දී අධිකාරිය විසින් ලබා ගන්නා සියළු මුදල් ද වෙනත් ආධාර හා ප්‍රදානයන් ද අධිකාරියේ අරමුදලට බැර කළ යුතුය.

19. අධිකාරියේ අරමුණු සපුරා ගැනීම පිණිස හෝ මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ එයට පැවරී ඇති බලතල, කාර්යයන්, රාජකාරි ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ, කාර්යය සාධනය සඳහා එකී අරමුදල් මණ්ඩලය තීරණය කරන ආකාරයට යොදා ගත හැකිය. අරමුදල යෙදවිය යුතු කරුණු.

20. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳවත්, වෙනත් සියළු ගනුදෙනු පිළිබඳවත් නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු අතර, අමාත්‍යවරයා විසින් පවරනු ලබන නියෝගවලින් නියම කරනු ලබන ආකාරයට හා නියම කරනු ලබන තොරතුරු ඇතුළත් කොට අධිකාරියට අදාළව ගිණුම් හා සංඛ්‍යා ලේඛන ඇතුළත් වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතුය. අධිකාරියේ ගිණුම්.

21. අධිකාරියේ මුදල් වර්ෂය ජනවාරි මස පළමු වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වේ. අධිකාරියේ මුදල් වර්ෂය.

22. (1) මුදල් වර්ෂය අවසාන වී මාස 03ක් ඉක්මවීමට පෙර අදාළ මුදල් වර්ෂය වෙනුවෙන් අධිකාරියේ ගිණුම් විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. අධිකාරියේ විගණනය.

(2) විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම පළාත් අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතුය.

(3) විගණකාධිපතිවරයා විසින් අධිකාරියේ ගිණුම් පරීක්ෂා කර, පහත සඳහන් කරුණු අඩංගු වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.
එනම් ;

(අ) තමන්ට අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිළි කිරීම් ලැබුණේ ද නැද්ද යන වග,
(ආ) අධිකාරියේ කටයුතු පිළිබඳව නිවැරදි හා සාධාරණ අදහසක් ලබා ගැනීමට හැකිවන පරිදි වාර්තාවේ සඳහන් ගිණුම් නිසියාකාරව සකස් කර තිබේද යන වග,
(ඇ) තම අදහස්වලට අනුව පළාත් සභාවේ අවධානයට යොමුවිය යුතු ගිණුම්වල අඩංගු යම් කරුණු හෝ අධිකාරියේ කටයුතු සහ ගිණුම් පිළිබඳව පරීක්ෂණයේ දී හෙළි වූ වැදගත් කරුණු.

23. විගණකාධිපතිවරයා විසින් ඔහුගේ වාර්තාව සමග විගණනය කරන ලද ගිණුම් ද අධිකාරියේ සභාපතිවරයා වෙත යැවිය යුතුය.

24. සභාපතිවරයා විසින් එකී විගණනය කරන ලද ගිණුම් හා විගණකාධිපතිවරයාගේ වාර්තාව තමාට ලැබුණු විට එම වාර්තාවට අදාළ මුදල් වර්ෂය තුළදී අධිකාරිය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාව ද සමග එම ගිණුම් වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් එම ගිණුම්වලට අදාළ මුදල් වර්ෂය ඉකුත්වී දොළොස් මසක් ගතවන්නට පළමුව ඒවායේ පිටපත් අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය. විගණකාධිපතිවරයාගේ වාර්තාව හා අධිකාරියේ වාර්ෂික කටයුතු පිළිබඳ වාර්තාව ද, ගිණුම් වාර්තාව ද, ඇමතිවරයාට ඉදිරිපත් කළ යුතු බව.

## IV කොටස

### පොදු විධිවිධාන

අධිකාරියේ සාමාජිකයන්, නිලධාරීන් රජයේ සේවකයින් ලෙස සැළකිය යුතු බව.

25. මණ්ඩලයේ සියළුම සාමාජිකයන්., අධිකාරියේ නිලධාරීන් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උප ලේඛනගත අධිකාරියක් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

26. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව, උප ලේඛනගත අධිකාරියක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

නියෝග.

27. (1) ප්‍රඥප්තියේ ප්‍රකාශිත හෝ නියමිත හෝ ප්‍රඥප්තියෙන් නියෝග සෑදීමට අවශ්‍ය සියළු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගවල නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට එම නියෝග ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අයුරින් අනුමත කරනු නොලැබූ නියෝගයක් වෙතොත් එය අනුමත කරනු ලැබූ සත් දින සිට අවලංගු කළා සේ සැළකිය යුතු බවත්, එම නියෝගයක් ගනු ලැබූ කවර හෝ ක්‍රියා මාර්ගයක් කෙරෙහි එම අවලංගුවීම බල නොපෑ යුතුය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් ගනු ලැබූ කවර හෝ ක්‍රියා මාර්ගයන් කවර දිනක සිටද යන්න දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

අන්තර්කාලීන විධිවිධාන.

28. පූර්ව ළමා අධ්‍යාපන ආයතනවල උපදේශිකාවන්ගේ අවම වෘත්තීය සුදුසුකම මණ්ඩලය විසින් නිශ්චය කිරීම හා මණ්ඩලය විසින් පවත්වනු ලබන නියෝගයකින් නිශ්චය කරනු ලබන දිනක සිට අවම වෘත්තීය සුදුසුකම් නොමැති පෙර පාසල් උපදේශිකාවන්ගේ සේවය අත්හිටවනු ලැබිය හැක්කේය.

රීති.

29. (i) රීති සෑදිය යුතු යයි බලය දෙන ලද හෝ මෙම ප්‍රඥප්තිය මගින් නියමකර ඇති හෝ කරුණුවලට අදාළව අධිකාරියට යම් රීති සම්පාදනය කළ හැකිය.

(ii) අධිකාරිය විසින් සම්පාදනය කරන ලද රීති අමාත්‍යවරයා විසින් අනුමත කරන තුරු බල සහිත නොවේ.

වැරදි හා දඬුවම්.

30. මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වී මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලබන සෑම තැනැත්තෙක් ම මාස හයක් නොඉක්මවන සිර දඬුවමකට හෝ රුපියල් පන්සීයක් නොඉක්මවන දඩයකට හෝ සිර දඬුවම හා දඩය යන දෙකටම හෝ යටත් වන්නේ ය.

අර්ථ නිරූපනය.

31. මෙම ප්‍රඥප්තියෙහි අන්‍යාකාරයකින් දක්වා ඇත්නම් මිස,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්,
වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා ද,

"පළාත් සභාව" යන්නෙන්,
වයඹ පළාතේ පළාත් සභාව ද,

"අමාත්‍යවරයා" යන්නෙන්,
වයඹ පළාතේ පළාත් සභාවේ අධ්‍යාපන විෂය පැවරී ඇති අමාත්‍යවරයා ද,

"පළාත් සභා රාජ්‍ය සේවය" යන්නෙන්,
1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති පළාත් සභා රාජ්‍ය සේවයක් ද,

"පූර්ව ළමා අධ්‍යාපන ආයතන" යන්නෙන්,

පෙර පාසල් හෝ එවැනි කාර්යයන්හි යෙදෙන වෙනත් ආයතන ද,

අදහස් කෙරේ.

32. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය. — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

04-323/1